බප/හො/පොලේගොඩ මහ විද්‍යාලය

# 7 ශ්‍රේණිය - 03 පාඩම

# අක්ෂර මාලාව සහ අක්ෂර වින්‍යාසය

ශබ්ද වලින් සෑදී ඇති භාෂාව ඇසට පෙනෙන ලෙස ලියා දැක්වීම අකුරු හෙවත් අක්ෂර යනුවෙන් හැඳින්වේ. වර්තමානයේ සම්මත සිංහල අක්ෂර මාළාව අකුරු 60 කින් යුක්තය. මෙම අක්ෂර 60 ප්‍රධාන වශයෙන් කොටස් 2 කි.

1. ස්වර
2. ව්‍යඤ්ජන

- එහෙත් අතීතයේ භාවිතා වූ සිදත් සඟරාවේ අක්ෂර 30 කි. එය පාඩම ඇසුරින් අවබෝධ කර ගන්න.
- අප භාවිතා කරන වර්තමාන සිංහල හෝඩියේ ව්‍යඤ්ජනාක්ෂර අතර, මහාප්‍රාණ අක්ෂර 10 ක් ද ඊට අනුරූප අල්ප ප්‍රාණ අක්ෂර 10 ක් ද තිබේ. එමෙන්ම සඤ්ඤක අක්ෂර සිංහල භාෂාවටම අනන්‍ය වූ අක්ෂර විශේෂයකි. (17, 18 පිටු තව දුරටත් බලන්න.)

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

හිස්තැනට අදාළ මහා ප්‍රාණ අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

| | | | |
|---|---|---|---|
| ප්‍රති.......ල | (ප, ඵ) | ජෝෂ්....... | (ඨ, ට) |
| .......නිජ තෙල් | (බ, ඛ) | කොට්.......සය | (ඨා, ටා) |
| ස්.......වරය | (තා, ථා) | සමාරම්.......ය | (බ, භ) |
| දීර්.......යුෂ | (ඝා, ගා) | සමෘද්.......ය | (ධි, දි) |
| රාජා.......ෂේක | (භි, බි) | | |

හිස්තැනට අදාළ මහා ප්‍රාණ හෝ අල්ප ප්‍රාණ අක්ෂරය වෘත්තය තුළ ඇති අකුරු අතුරින් තෝරා ලියන්න.

අජ.......කාශගාමීන්
පිරිත් සජ්.......යනය
සණ්.......නාදය
සමාජ දෘෂ්.......ය
ඩෙංගු මර්.......නය
නිෂ්.......ල කාර්යයන්
ත්‍යාග
ප්‍ර.......නෝත්සවය
පෘ.......වි ගෝලය
ශබ්ද මා.......ර්යය
ස්.......ප වන්දනාව

තූ
ටා ඨා
දා ඩා
දු ඩ
ද ධු ඣා
ටි ථි ඡා
ඵි

# සඤ්ඤක අක්ෂර භාවිතය

පහත සදහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- සිංහල හෝඩියේ සඤ්ඤක අක්ෂර ගණන කීයද?
- එම අක්ෂර ලියා දක්වන්න.
- වර්තමාන ලේඛන ව්‍යවහාරයේ දක්නට නොමැති සඤ්ඤක අක්ෂරය ලියන්න.
- පදයක මුලට නොයෙදෙන අක්ෂර මොනවාද?
- ව්‍යඤ්ජනාක්ෂර අතර හල් වී නොයෙදෙන අක්ෂර ලියන්න.

පහත සඳහන් හිස්තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

01. තාත්තා වැට මායිමේ ........................................ කැපීමේදී කෝදුව ගෙන එහි ප්‍රමාණය ........................................ මැන්නේය. (අඟල, අගල)

02. නංගී පොල් ........................................ලය ගැමට බැරියැයි ........................................මින් කෑ ගැසුවාය. (අඩ, අඬ)

03. විනෝදනී ........................................උදේ පාසල් යන විට පාර මාරු වීමට සිටි .......................... මිනිසාට උදව් කළාය. (අද, අඳ)

04. අම්මා අච්චාරුවට .......................... දමා සාදන විට නංගී .......................... ගෙඩියක් කෑවාය. (අබ, අඹ)

# අක්ෂර වින්‍යාස රීති
# “න”, “ණ” අක්ෂර භාවිතය

19-22 දක්වා පෙළ පොතේ පිටු අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. සුදුසු වචන හා අක්ෂර යොදා හිස්තැන් පුරන්න.

1. මූර්ධජ ණ යෙදීමෙන් ආරම්භ වන එකම වචනය ..................... වේ.
2. පදයක අවසානයේ ............................ හල් වී නොයෙදේ.
3. නාමපද වල විශේෂණ පද වල ....................... යන්නට පසුව යෙදෙන්නේ ....................... කාරයයි.
4. රකාරාංශය සහිත අක්ෂරයකට පසුවද යෙදෙන්නේ .................. කාරයයි.
5. ත.........ද.........න යන අකුරකට හල් වී යෙදෙන්නේ ................ අක්ෂරයයි.
6. මූර්ධජ “ෂ” කාරයට පසුව යෙදෙන්නේ ................ කාරයයි.
7. ..................... යන්නෙහි රකාරාංශයක් සහිත නම් එතැන යෙදෙන්නේ මූර්ධජ “ණ” යන්නයි.
8. ගෞරවාර්ථය හැඟවීමට භාවිත කරන පද වල ...................... යන්න යෙදේ.

මෙම වචන වලට ගැලපෙන අකුරු යොදා හිස්තැන් පුරවන්න.

- ...........ය හිමියා (න, ණ)
- අධිකර.......... (න, ණ)
- අදි.......... (ටන්, ටන)
- නිර්වා......... (න, ණ)
- තෘ......... (ණ, න)
- මිතුර......... (ණ්, න්)
- සම්මිශ්‍ර......... (න, ණ)
- අස්ස...... (න, ණ)
- කන්........ඩි (නා, ණා)

# ල, ළ අක්ෂර භාවිතය

- මූර්ධජ “ළ” යන්නෙන් යන්නෙන් ආරම්භ වන පද ඒවායේ අර්ථ අනුව ප්‍රභේද කීපයකට වෙන් කළ හැකිය. පෙළ පොතේ 23 පිටුව බලන්න.

i. හෘදය, ළපටි, සමීප වැනි අදහස් ඇති වචනවල මුලට යෙදෙන්නේ ........... කාරයයි. (ල, ළ)

ii. පදයක අවසානයේ හල් වී යෙදෙන්නේ ................ අකුරයි. (ල, ළ)

iii. “පිළි” යන්නෙන් පටන් ගන්නා අකුරු ලිවිය යුත්තේ .............. කාරයෙනි. (ල, ළ)

iv. එකතැන “ළ” කාර දෙකක් යෙදුනු කල පළමුව යෙදිය යුත්තේ ............... කාරයයි. (ල, ළ)

v. පොළ යන්නෙන් ලිවීමේදී ලිවිය යුත්තේ ............... කාරයයි. (ල, ළ)

# ශ, ෂ, ස අක්ෂර භාවිතය

- පෙළ පොතේ 24 පිටුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

  - ..........රීරය
  - ..........ෂ්ටාචාරය
  - ඖ..........ධ
  - දර්..........න
  - දේ..........ය
  - ..........මය
  - පර්..........ද
  - ..........රල
  - ප්‍රදේ..........ය
  - ..........තුට
  - ලක්..........ණ
  - ප්‍ර.........ංසාව

**ශ, ෂ, ස**